[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2015 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2015

| | | |
|---|---|---|
| නාට්‍ය හා රංගකලාව - සිංහල I<br>நாடகமும் அரங்கியலும் - சிங்களம் I<br>Drama and Theatre - Sinhala I | 57 S I | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours |

විභාග අංකය : ..........................................

| | |
|---|---|
| I කොටස | |
| මුළු ලකුණු | 40 |

**උපදෙස්:**

※ **I** කොටස – **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයා, **II** කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

※ **II** කොටස – **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

● නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**1.** පහත දැක්වෙන්නේ 'ලලිතකලා' පිළිබඳ ප්‍රකාශ කිහිපයකි. ලලිතකලා යනු,

A - භාව ප්‍රකෝප කෙරෙන කලාවකි.
B - බුද්ධියට ආමන්ත්‍රණය කරන කලාවකි.
C - ශිල්පීය වශයෙන් පරිපූර්ණ බවින් යුත් කලාවකි.
D - රස වින්දනය අසීරු වූවකි.
E - ජීවිත පරිඥානය පුළුල් කරන්නකි.

ඉහත ප්‍රකාශ අතුරෙන් ලලිතකලාවට අදාළ නිවැරදි ප්‍රකාශ තුන ඇතුළත් වරණය තෝරන්න.

(1) ABD (2) ACE (3) BCE (4) BCD (5) BDE (.........)

**2.** පහත දැක්වෙන්නේ ප්‍රාසංගික කලාවට සම්බන්ධ ප්‍රකාශ කිහිපයක්.

A - සංගීතය, නර්තනය, නාට්‍යය ප්‍රාසංගික කලා වේ.
B - ප්‍රේක්ෂක සහභාගිත්වය අත්‍යවශ්‍ය නො වේ.
C - චතුර් අභිනය උචිත පරිදි යොදා ගැනේ.
D - ශ්‍රව්‍ය-දෘශ්‍ය නො වන කලාවකි.
E - ගායනය, රංගනය හා චලනය පදනම් කරගෙන රංගභූමියක් මත නිරූපණය කෙරෙන කලාවකි.

ඉහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් ප්‍රාසංගික කලාවට අදාළ නිවැරදි ප්‍රකාශ තුන ඇතුළත් වරණය තෝරන්න.

(1) ACE (2) BCE (3) BDE (4) CDE (5) DCE (.........)

**3.** කලාව නිර්වචනය කිරීම අසීරු වන්නේ,

(1) එය පුද්ගලබද්ධ බැවිනි.
(2) එහි විෂය ක්ෂේත්‍රය අසීමිත බැවිනි.
(3) එය ප්‍රතිභාව මත පදනම් වන බැවිනි.
(4) එහි විවිධ වර්ගීකරණ ඇති බැවිනි.
(5) එය ස්වභාවධර්මය හා සම්බන්ධ බැවිනි. (.........)

**4.** 'ගීත නාටක' යනු,

(1) බටහිර 'බැලේ' ආභාසය සහිත නාට්‍ය වර්ගයකි.
(2) රංගභූමි අලංකරණයට ප්‍රමුඛත්වය හිමි වන නාට්‍ය විශේෂයකි.
(3) ගායනයට ප්‍රමුඛත්වයක් හිමි වන නාට්‍ය විශේෂයකි.
(4) මුද්‍රා නාට්‍යයට බෙහෙවින් සමාන වන නාට්‍ය විශේෂයකි.
(5) අභිනය භාවිත නො වන කලාවකි. (.........)

**5.** 'නෘත්‍ය' යනු,

(1) ආංගික අභිනය පමණක් භාවිත කෙරෙන නර්තනයකි.
(2) රිද්මයක්, අර්ථයක්, මනෝභාවයක් සහිත නර්තනයකි.
(3) 'නෘත්ත' යන පදයට සමාන අරුත් දෙන්නකි.
(4) නර්තනය පුහුණු වන අවස්ථාවේ පමණක් අදාළ වන්නකි.
(5) නාට්‍ය කලාවෙහි කිසිවිටක නොයෙදෙන්නකි. (.........)

**6.** නාට්‍ය අධ්‍යක්ෂවරයකුගේ කාර්යභාරය සම්බන්ධ වඩාත් නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) නාට්‍ය පෙළක් රචනා කිරීම
(2) නාට්‍යයේ අර්ථපති ලෙස ක්‍රියා කිරීම
(3) නාට්‍ය පෙළ සජීවී කලා මාධ්‍යයක් ලෙස වේදිකාව මත ප්‍රතිනිර්මාණය කිරීම
(4) රංගභූමි අලංකරණය පරීක්ෂා කිරීම
(5) නාට්‍ය නිෂ්පාදනය පිළිබඳ මූලික වගකීමෙන් බැහැරවීම (.........)

[ දෙවැනි පිටුව බලන්න.

7. රංගභූමිය හැඳින්වීම සඳහා භාවිත වන පොදු වන නාම වන්නේ,
(1) ස්කීනි, ග්ලෝබ් හා ප්‍රොසීනියම් ය. (2) ප්‍රේක්ෂකාලය, ඕර්කෙස්ට්‍රාව හා ස්කීනී ප්‍රොන්ස් ය.
(3) රංගපීඨය, රඟමඬල, කරළිය හා වේදිකාව ය. (4) කමත, වේදිකාව, තානායම් පොළ හා ප්‍රේක්ෂකාලය ය.
(5) කරළිය, සබය, වේදිකාව හා ස්කීනී ය. (………)

8. 'ආහාර්ය අභිනය' වශයෙන් හැඳින්වෙන්නේ,
(1) ආංගික අභිනයෙන් ප්‍රකට කෙරෙන අදහස් ය. (2) ආලෝකය සහ ගීත ගායනා ය.
(3) නාට්‍යෝපකරණ, සංගීතය හා භාව ප්‍රකාශන ය. (4) නළුවා බැහැරින් ආරෝපණය කරගන්නා දෑ ය.
(5) වේදිකාව මත ඇති සියලු දෑ ය. (………)

9. නාට්‍යයක 'ගැටුම' යනු,
(1) නාට්‍යයේ නළුවන් අතර ඇතිවන්නකි.
(2) ප්‍රේක්ෂකයා නාට්‍යය කෙරෙහි දැඩි ව රඳවා ගැනීමට හේතුවන්නකි.
(3) කථාව හා ක්‍රියාව අතර සිදුවන්නකි.
(4) සිද්ධි හා අවස්ථා තර්කානුකූල ව පෙළගැස්වීමයි.
(5) නාට්‍ය නරඹන ප්‍රේක්ෂකයන්ගේ ප්‍රතිචාරයයි. (………)

10. රූපණයෙහි සාර්ථකත්වයට අත්‍යවශ්‍යයෙන් ම පුහුණු කළ යුත්තේ,
(1) හඬ අභ්‍යාස ය. (2) සංවාද මතක තබා ගැනීම ය.
(3) සාත්ත්වික අභිනය ය. (4) ශිථිලීකරණ සංවේදන, හඬ හා පරිකල්පන අභ්‍යාස ය.
(5) ශිථිලීකරණ අභ්‍යාස ය. (………)

11. නූතන ප්‍රොසීනියම් වේදිකාව බෙදා ඇත්තේ මනඃකල්පිත කොටස්,
(1) තුනකට ය. (2) අටකට ය. (3) නවයකට ය. (4) දහයකට ය. (5) දොළහකට ය.(………)

12. භරතමුනිගේ නාට්‍යශාස්ත්‍රයෙහි අන්තර්ගත රස සංඛ්‍යාව,
(1) හතකි. (2) අටකි. (3) නවයකි. (4) දහයකි. (5) දොළහකි. (………)

13. මධ්‍යකාලීන යුරෝපීය නාට්‍ය රඟ දක්වන ලද්දේ,
(1) ප්‍රොසීනියම් සහ ඒප්‍රනාකාර වේදිකාවක ය.
(2) ඕර්කෙස්ට්‍රා නම් ස්ථානයක ය.
(3) මණ්ඩප වේදිකා, සංදර්ශන රථ සහ ප්ලැටියා හෙවත් පොදු රංගභූමිවල ය.
(4) විකෘෂ්ට සහ චතුරස්‍රාකාර රංගභූමිවල ය.
(5) කෝවියා, ආරුක්කු සහ මණ්ඩප වේදිකාවල ය. (………)

14. 'රංගභූමි තාක්ෂණය' යනු,
(1) වේදිකාව මත හැකි තරම් යන්ත්‍රෝපකරණ භාවිතයයි.
(2) වේදිකාව තනා ගැනීමේ ශිල්පයයි.
(3) වේදිකාව මත නාට්‍යයෙන් නිරූපණය වන අවස්ථා වඩා තීව්‍ර හා චමත්කාර කිරීමට තාක්ෂණය භාවිත කිරීමයි.
(4) ශබ්දය මැනැවින් ශ්‍රවණය වීම සඳහා උපකරණ භාවිත කිරීමයි.
(5) නාට්‍යයේ භාවිත කෙරෙන වේදිකා මෙවලම් ආදිය භාවිත කිරීමේ තාක්ෂණයයි. (………)

15. නාට්‍යධර්මී නාට්‍යයක ලක්ෂණයක් වන්නේ,
(1) ආත්ම භාෂණවලින් තොර වීම ය.
(2) වේදිකා සැරසිලි බහුල වීම ය.
(3) චතුර් අභිනය අවම වශයෙන් උපයෝගී වීම ය.
(4) සංවාද එදිනෙදා ජීවිතයේ යෙදෙන ආකාරයට පමණක් භාවිත කිරීම ය.
(5) විවිධ විධි නියමයනට අනුව රංග පීඨය මත ඉදිරිපත් කරන කථ්‍යා විභාගය ය. (………)

16. නළු පරම්පරා පිළිබඳ ප්‍රසිද්ධියක් උසුලන්නේ,
(1) ශ්‍රී ලංකාව ය. (2) චීනය ය. (3) ජපානය ය. (4) රුසියාව ය. (5) ඉන්දියාව ය. (………)

● පහත දැක්වෙන මාතෘකා අධ්‍යයනය කොට අංක **17** සිට **22** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| A - ආකූලීකරණය | G - ප්‍රකරණ | M - පසුතල නිර්මාණ |
| B - ආධිකාරික | H - නළුවරණය | N - බුතයි |
| C - සඳුපදේශ | I - ජෝ-හා-ක්‍යු | O - ඒප්‍රනාකාර වේදිකාව |
| D - ග්ලෝබ් | J - දුඃඛප්‍රාප්ති | P - වේදිකා පරිපාලනය |
| E - කොතුර්නොස් | K - ධීරෝදාත්ත | Q - කැටපත් කාමරය |
| F - එඬේර නාටක | L - ඩිතිරම්බ් | R - නළු සමාගම් |

17. මධ්‍යකාලීන නාට්‍ය කලාව හා සම්බන්ධ වනුයේ,
(1) C, D හා O ය. (2) C, F හා J ය. (3) D, J හා Q ය. (4) D, L හා O ය. (5) J, N හා Q ය. (………)

[ තුන්වැනි පිටුව බලන්න.

18. සංස්කෘත නාට්‍ය කලාව හා සම්බන්ධ වන්නේ,
(1) B, G හා K ය. (2) C, G හා K ය. (3) E, J හා K ය. (4) G, L හා M ය. (5) K, D හා Q ය. (.........)

19. ග්‍රීක නාට්‍ය කලාව හා සම්බන්ධ වන්නේ,
(1) A, H හා L ය. (2) A, E හා L ය. (3) D, F හා L ය. (4) E, D හා Q ය. (5) E, J හා N ය. (.........)

20. එළිසබෙතීන නාට්‍ය කලාව හා සම්බන්ධ වන්නේ,
(1) C, E හා O ය. (2) C, N හා R ය. (3) D, M හා O ය. (4) D, J හා Q ය. (5) D, O හා R ය. (.........)

21. පොදුවේ නාට්‍ය කලාව හා සම්බන්ධ වන්නේ,
(1) B, H හා Q ය. (2) D, M හා P ය. (3) F, M හා O ය. (4) H, M හා P ය. (5) I, O හා P ය. (.........)

22. ජපන් නාට්‍ය කලාව හා සම්බන්ධ වන්නේ,
(1) D, J හා L ය. (2) E, I හා Q ය. (3) F, I හා N ය. (4) H, N හා Q ය. (5) I, N හා Q ය. (.........)

23. නියුමාන් ජුබාල් සම්බන්ධ වන්නේ,
(1) නාඩගම් සම්ප්‍රදායට ය. (2) අභූතරූපී රංග කලාවට ය.
(3) නූතන නාට්‍ය කලාවට ය. (4) ලංකා විශ්වවිද්‍යාලීය නාට්‍ය සංගමයට ය.
(5) ලංකාවේ පාස්කු නාට්‍ය සම්ප්‍රදායට ය. (.........)

24. සී. දොන් බස්තියන් සම්බන්ධ වන්නේ,
(1) සොකරි නාට්‍යයට ය. (2) කෝලම් සම්ප්‍රදායට ය.
(3) ලංකා විශ්වවිද්‍යාලීය සිංහල සමිතියට ය. (4) නූර්තියට ය.
(5) ලංකාවේ ඉංග්‍රීසි නාට්‍ය කලාවට ය. (.........)

25. ඊ.එෆ්.සී. ලුඩොවයික් සම්බන්ධ වන්නේ,
(1) ලංකාවේ නූතන නාට්‍ය කලාවට ය.
(2) ලංකාවේ ඉංග්‍රීසි නාට්‍ය කලාවට ය.
(3) ලංකා විශ්වවිද්‍යාලීය සිංහල සමිතියේ නාට්‍යවලට ය.
(4) නාඩගම් සම්ප්‍රදායට ය.
(5) ටීටර් හා මිනර්වා සම්ප්‍රදායට ය. (.........)

26. බී.ඒ.ඩබ්. ජයමාන්න සම්බන්ධ වන්නේ,
(1) නූර්ති සම්ප්‍රදායට ය. (2) ටීටර් හා මිනර්වා සම්ප්‍රදායට ය.
(3) නාඩගම් සම්ප්‍රදායට ය. (4) කෝලම් සම්ප්‍රදායට ය.
(5) ලංකාවේ ඉංග්‍රීසි නාට්‍ය කලාවට ය. (.........)

- පහත දැක්වෙන වගුව අධ්‍යයනය කොට අංක **27** සිට **31** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | මුල් නාට්‍යය | රචකයා | සිංහල පරිවර්තනය | අනුවර්තක/පරිවර්තක |
|---|---|---|---|---|
| (අ) | රත්නාවලී නාටිකා | ශ්‍රී හර්ෂ | රත්නාවලී | **A** |
| (ආ) | ගුඩ් වුමන් ඔෆ් සෙට්සුවාන් | බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් | **B** | සුගතපාල ද සිල්වා |
| (ඉ) | එනිමි ඔෆ් ද පීපල් | **C** | ජනහතුරා | සුනන්ද මහේන්ද්‍ර |
| (ඊ) | **D** | විලියම් ශේක්ස්පියර් | හැමෝටම වැරදිලා | බන්දුල විතානගේ |
| (උ) | යෙර්මා | **E** | මුහුදු පුත්තු | ගුණසේන ගලප්පත්ති |

27. 'අ' පේළියේ '**A**' සඳහා සුදුසු වරණය තෝරන්න.
(1) නියුමාන් ජුබාල් (2) පියදාස නිශ්ශංක (3) බන්දුල ජයවර්ධන
(4) දයානන්ද ගුණවර්ධන (5) කපිල කුමාර කාලිංග (.........)

28. 'ආ' පේළියේ '**B**' සඳහා සුදුසු වරණය තෝරන්න.
(1) දිරිය මව සහ ඇගේ දරුවෝ (2) හරිම බඩු හයක් (3) විලාසිනියකගේ ප්‍රේමය
(4) හිත හොඳ අම්මණ්ඩි (5) සයුරෙන් ආළඳ (.........)

29. 'ඉ' පේළියේ '**C**' සඳහා සුදුසු වරණය තෝරන්න.
(1) හෙන්රික් ඉබ්සන් (2) ජර්සි ග්‍රොටොව්ස්කි (3) සැමුවෙල් බෙකට්
(4) ඇන්ටන් චෙකොෆ් (5) අර්වින් පිස්කැටර් (.........)

30. 'ඊ' පේළියේ '**D**' සඳහා සුදුසු වරණය තෝරන්න.
(1) මිඩ් සමර් නයිට්ස් ඩ්‍රීම් (2) ට්වෙල්ත් නයිට් (3) ද ගෝස්ට්
(4) කොමඩි ඔෆ් එරර්ස් (5) ක්‍රුසිබල් (.........)

31. 'උ' පෙළියේ '**E**' සඳහා සුදුසු වරණය තෝරන්න.
(1) ජෝර්ජ් බර්නාඩ් ෂෝ (2) බෙන් ජොන්සන් (3) ඉයුජින් අයනෙන්කෝ
(4) ටෙනසි විලියම්ස් (5) ෆෙඩ්රිකෝ ගාෂියා ලෝර්කා (………)

32. පහත දැක්වෙන්නේ නාට්‍ය කලාවට අදාළ පද කිහිපයකි.
(i) - කාව්‍යශාස්ත්‍රය (ii) - ආමුඛය (iii) - හෂිගකරි (iv) - වෙළඳ ශ්‍රේණි (v) - ආත්ම භාෂණ
ඉහත දැක්වෙන අනුපිළිවෙළට ඒවා නියෝජනය කරන නාට්‍ය සම්ප්‍රදායන් දැක්වෙන වරණය තෝරන්න.
(1) එළිසබෙතීන, මධ්‍යකාලීන, ග්‍රීක, සංස්කෘත, ජපාන
(2) ජපාන, සංස්කෘත, ග්‍රීක, එළිසබෙතීන, මධ්‍යකාලීන
(3) ග්‍රීක, එළිසබෙතීන, සංස්කෘත, ජපාන, මධ්‍යකාලීන
(4) සංස්කෘත, ග්‍රීක, මධ්‍යකාලීන, එළිසබෙතීන, ජපාන
(5) ග්‍රීක, සංස්කෘත, ජපාන, මධ්‍යකාලීන, එළිසබෙතීන (………)

- ප්‍රශ්න අංක **33** සිට **36** තෙක් දී ඇති එක් එක් නාට්‍ය සම්ප්‍රදායට අදාළ ප්‍රකාශ අතුරෙන්, ඒ එකිනෙකට අදාළ **නොවන** වරණය තෝරන්න.

33. ජපාන 'නෝ' නාට්‍ය,
(1) ස්ත්‍රී චරිත රඟපානු ලබන්නේ පිරිමින් විසිනි. (2) බෙහෙවින් පදනම් වී ඇත්තේ බෞද්ධ තේමා මත ය.
(3) ප්‍රධාන අනුග්‍රාහකයන් වූයේ ප්‍රභූ පක්ෂයයි. (4) 'මල්මග' හෙවත් 'හනමිචිය' භාවිතයට ගනු ලැබේ.
(5) කබුකි නාට්‍යයට වඩා පැරණි ය. (………)

34. විලියම් ශේක්ස්පියර්ගේ නාට්‍ය,
(1) ට්‍රැජඩි, කොමඩි හා ඓතිහාසික වශයෙන් වර්ග කළ හැකි ය.
(2) රඟ දක්වන ලද්දේ අපරභාගයේ ය.
(3) දර්ශන කිහිපයක් ඇතුළත් අංක පහකින් සමන්විත ය.
(4) විශේෂ අනුග්‍රහයක් දැක්වූයේ **II** වැනි එළිසබෙත් රැජින ය.
(5) රචනා කරන ලද නාට්‍ය සංඛ්‍යාව 37 කි. (………)

35. ග්‍රීක නාට්‍ය,
(1) සියලු ම ග්‍රීක නාට්‍ය ප්‍රභේද තුනකට වෙන්කොට දැක්විය හැකි ය.
(2) දැනට ලැබී ඇති සියලු ම ග්‍රීක නාට්‍ය රචකයන් පස් දෙනකුට අයත් ය.
(3) සියලු ම ග්‍රීක නාට්‍ය රචනා වී ඇත්තේ පද්‍යයෙනි.
(4) නාට්‍ය රඟ දක්වන ලද්දේ රාත්‍රි කාලයේ ය.
(5) 'අර්ථපති' හඳුන්වනු ලැබුයේ 'කොරිගොස්' යනුවෙනි. (………)

36. සංස්කෘත නාට්‍ය,
(1) දැනට හමු වී ඇති පැරණි ම සංස්කෘත නාට්‍යය ශාරිපුත්‍රප්‍රකරණයයි.
(2) ප්‍රකට සංස්කෘත නාට්‍යකරුවන් අතර අවසාන නාට්‍යකරු වන්නේ රාජශේඛර ය.
(3) රස නිෂ්පත්තියට ප්‍රමුඛස්ථානයක් හිමි වේ.
(4) සංස්කෘත නාට්‍යයට ග්‍රීක නාට්‍ය බෙහෙවින් බලපා ඇත.
(5) ස්ත්‍රී චරිත රඟපාන ලද්දේ ස්ත්‍රීන් විසිනි. (………)

- ප්‍රශ්න අංක **37** සිට **40** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරන්න.

37. ග්‍රීක නාට්‍යයක 'ප්‍රත්‍යාවර්තනය' යනු,
(1) සිද්ධි පෙළගැස්වීමේ අනුපිළිවෙළයි.
(2) ශෝකජනකයේ ගැටුමයි.
(3) ග්‍රීක නාට්‍ය රචනා කිරීමේ දී අනුගත නාට්‍ය රීතියයි.
(4) ග්‍රීක ශෝකජනකයේ වීරයාගේ භාග්‍ය පරිවර්තනයක් සමඟ සිදුවීම් වෙනතකට හැරීමයි.
(5) භාව විශෝධනයට තුඩුදෙන්නා වූ මූලික හේතුවයි. (………)

38. 'වස්තුව' නාට්‍යයේ ශරීරය ලෙස හඳුන්වා ඇත්තේ,
(1) ඇරිස්ටෝටල් ය. (2) හෙන්රික් ඉබ්සන් ය. (3) දන්ජුරෝ ය.
(4) භරතමුනි ය. (5) කාලිදාස ය. (………)

39. 'ආඛ්‍යාන රංගය' ලොව ප්‍රචලිත කරන ලද්දේ,
(1) බර්නාඩ් ෂෝ ය. (2) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් ය. (3) සැමුවෙල් බෙකට් ය.
(4) ස්ටැනිස්ලාව්ස්කි ය. (5) ආතර් මිලර් ය. (………)

40. 'ලෝක ධර්මී' හා 'නාට්‍ය ධර්මී' නම් වූ වර්ගීකරණය අඩංගු වන්නේ,
(1) ඇරිස්ටෝටල්ගේ කාව්‍යශාස්ත්‍රයේ ය. (2) ධනඤ්ජයගේ දශරූපකයේ ය.
(3) භරතමුනිගේ නාට්‍යශාස්ත්‍රයේ ය. (4) ප්ලේටෝගේ ජනරජයේ ය.
(5) නන්දිකේශ්වරගේ අභිනයදර්පණයේ ය. (………)

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2015 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2015

නාට්‍ය හා රංගකලාව - සිංහල I
நாடகமும் அரங்கியலும் - சிங்களம் I
Drama and Theatre - Sinhala I

57 S I

9066

## II කොටස

**උපදෙස්:**

※ **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.

### A කොටස

1. (i) ප්‍රාසංගික කලා **හතරක්** හඳුන්වන්න. (ලකුණු 04 යි.)
   (ii) ඉන් **එක්** කලාවක් පිළිබඳ ව පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)
   (iii) ඉහත (ii) ට අදාළ ව ඔබ පැහැදිලි කළ කලාව සෙසු කලා හා සංසන්දනය කරමින්, එහි දක්නට ලැබෙන වෙනස්කම් **තුනක්** පෙන්වා දෙන්න. (ලකුණු 06 යි.)

2. (i) නාට්‍යයක 'වස්තුව' යන්නෙන් අදහස් කෙරෙන්නේ කුමක් ද? (ලකුණු 04 යි.)
   (ii) ඇරිස්ටෝටල්ගේ කාව්‍යශාස්ත්‍රයේ 'වස්තුව (Plot)' යන්න කෙසේ විග්‍රහ වන්නේ ද? (ලකුණු 05 යි.)
   (iii) භරතමුනිගේ නාට්‍යශාස්ත්‍රයේ සඳහන් 'වස්තුවේ' අංග **පහ** නම් කරන්න. (ලකුණු 06 යි.)

3. (i) නාට්‍ය කලාවේ 'භූමිකා නිරූපණය' යනු කුමක් ද? (ලකුණු 04 යි.)
   (ii) භූමිකා නිරූපණය සඳහා සුදුසු මාතෘකා **පහක්** දක්වන්න. (ලකුණු 05 යි.)
   (iii) භූමිකා නිරූපණයේ දී සැලකීමට ලක්විය යුතු කරුණු **තුනක්** දක්වන්න. (ලකුණු 06 යි.)

### B කොටස

4. (i) 'රූපණය' යන්න හඳුන්වා දෙන්න. (ලකුණු 04 යි.)
   (ii) රූපණ කුශලතා ප්‍රගුණ කිරීමේ දී සැලකිය යුතු කරුණු **පහක්** දක්වන්න. (ලකුණු 05 යි.)
   (iii) රූපණය සම්බන්ධ ව බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් හා ස්ටැනිස්ලාව්ස්කි පළ කොට ඇති අදහස් වෙන් වෙන් වශයෙන් ලියා දක්වන්න. (ලකුණු 06 යි.)

5. (i) 'ඇන්ටිගනී' සහ 'ජූලියස් සීසර්' යන නාට්‍ය දෙකින් **එකක්** තෝරාගෙන, එහි තේමාව පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)
   (ii) ඇන්ටිගනීගේ චරිතය පිළිබඳ කරුණු **පහක්** දක්වන්න. (ලකුණු 05 යි.)
   (iii) 'ජූලියස් සීසර්' සහ 'බ්‍රූටස්' යන චරිත පිළිබඳ ඔබේ ආකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

6. (i) 'අභිඥානශාකුන්තලය' සහ 'රූකඩ ගෙදර' යන නාට්‍ය දෙකින් **එකක්** තෝරාගෙන, එහි 'නායිකාව'ගේ චරිත ලක්ෂණ සැකෙවින් දක්වන්න. (ලකුණු 04 යි.)
   (ii) මහාකවි කාලිදාස සිය නාට්‍යය 'අභිඥානශාකුන්තලය' යනුවෙන් නම් කොට ඇත්තේ කවර හෙයින් දැයි පහදන්න. (ලකුණු 05 යි.)
   (iii) 'රූකඩ ගෙදර' නාට්‍යයේ 'රූකඩිය' වශයෙන් හැඳින්වෙන්නේ කවුද? ඊට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

※ ※ ※

AL/2015/57/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2015 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2015

නාට්‍ය හා රංගකලාව - සිංහල II
நாடகமும் அரங்கியலும் - சிங்களம் II
Drama and Theatre - Sinhala II

57 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

විභාග අංකය : ...................................

| | |
|---|---|
| I කොටස | |
| මුළු ලකුණු | 40 |

**උපදෙස්:**

* I කොටස – **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයා, II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
* II කොටස – A හා B කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

* එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියෙන් ඇති **වරහන තුළ** ලියන්න.

**1.** 'හස්තිකාන්ත මන්තරේ' නාට්‍යය සඳහා මූලාශ්‍රය වී ඇත්තේ පහත සඳහන් කෘති අතුරෙන් කුමන කෘතිය ද?
(1) ප්‍රියදර්ශිකාව (2) මාලවිකාග්නිමිත්‍රය (3) ඌරුභංගය
(4) රත්නාවලිය (5) ප්‍රතිඥායෞගන්ධරායණය (.........)

**2.** පහත දැක්වෙන්නේ එක්තරා නාට්‍යයක ඇතුළත් වන දෙබස් ඛණ්ඩයකි.

'ඇයට කැප වුණා වූ මා හදින් සේ සියැස්නෙන්
සොඳුරිය දැක ගැනීමේ ප්‍රීතියෙන් මා සිටිද්දී
ඇති තතු නැවතත් දැන් සී කිරීමෙන් කෙළේ මේ
යළිදු එ මගෙ පෙම් සිත්තමක් සේ කිරීමයි'

මෙම දෙබස් ඛණ්ඩය අයත් වන්නේ,
(1) ඔතෙලෝ නාට්‍යයටයි. (2) හස්තිකාන්ත මන්තරේ නාට්‍යයටයි.
(3) අභිඥානශාකුන්තලයටයි. (4) රූකඩගෙදර නාට්‍යයටයි.
(5) ඇන්ටිගනී නාට්‍යයටයි. (.........)

**3.** පහත දැක්වෙන්නේ ඇන්ටිගනී නාට්‍යයේ එන පද්‍යයකි.

'ගියද අවසන් ගමන් කුමරිය
කරති බුහුමන් නුවර සැම දන
ලෙඩ දුකින් පිරිපතින් නොතැවී
කඩු පතින් ගත ගැහැට නොම වී .........'

'ඇන්ටිගනී' නාට්‍යයේ ඉහත සඳහන් පද්‍යය ගයන්නේ,
(1) හීමන් ය. (2) ඉස්මෙන් ය.
(3) ටෙරේසියස් ය. (4) ගානවෘන්දය ය.
(5) මුර සෙබළා ය. (.........)

**4.** 'ජුලියස් සීසර්' නාට්‍යයේ සීසර්ගේ ඝාතනය සිදුවන්නේ කුමන අංකයේ දී ද?
(1) පළමුවැනි අංකයේ (2) දෙවැනි අංකයේ
(3) තුන්වැනි අංකයේ (4) සිව්වැනි අංකයේ
(5) පස්වැනි අංකයේ (.........)

**5.** 'රූකඩගෙදර' නාට්‍යයේ නෝරාගේ චරිතය හා සම්බන්ධ ප්‍රධාන සංකේත තුන වන්නේ,
(1) කළු කාඩ් පත්, තරන්තලා හා තැඹුරීනය ය. (2) මැකරූන්, තරන්තලා හා නත්තල් ගස ය.
(3) පියානෝව, නත්තල් ගස හා පැන ය. (4) සෙල්ලම් අශ්වයා, මැකරූන් හා තරන්තලා ය.
(5) නත්තල් ගස, පියානෝව හා සීත කබාය ය. (.........)

[ දෙවැනි පිටුව බලන්න.

● පහත දැක්වෙන මාතෘකා ඇසුරෙන් අංක **6** සිට **11** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - වඩිග පටුන
B - සේරමාන්
C - අනුරුපණ
D - සී. දොන් බස්තියන් ජයවීර
E - මැණික්පාල ශාන්තිය
F - පිලිප්පුසියස්ශෝ
G - හරිශ්චන්ද්‍ර
H - චාල්ස් ඩයස් අමරතුංග
I - කාරියකරවන රාල
J - තානායම් පොළ
K - වොක්රි
L - දෙවොල් ගොඩබෑසීම

6. නූර්තියට අදාළ වන්නේ,
(1) B හා C ය. (2) D හා H ය. (3) D හා L ය. (4) G හා H ය. (5) K හා L ය. (.........)

7. කෝලම් නාට්‍යයට අදාළ වන්නේ,
(1) A හා B ය. (2) C හා K ය. (3) F හා I ය. (4) I හා J ය. (5) J හා L ය. (.........)

8. නාඩගම්වලට අදාළ වන්නේ,
(1) A හා C ය. (2) E හා G ය. (3) F හා G ය. (4) G හා L ය. (5) I හා J ය. (.........)

9. සොකරියට අදාළ වන්නේ,
(1) A හා E ය. (2) B හා L ය. (3) C හා K ය. (4) C හා L ය. (5) E හා F ය. (.........)

10. සූනියම් යාගයට අදාළ වන්නේ,
(1) A හා E ය. (2) B හා E ය. (3) C හා F ය. (4) C හා K ය. (5) F හා K ය. (.........)

11. පහන්මඩුවට අදාළ වන්නේ,
(1) A හා E ය. (2) B හා L ය. (3) C හා F ය. (4) C හා K ය. (5) E හා L ය. (.........)

● පහත දැක්වෙන මාතෘකා ඇසුරෙන් අංක **12** සිට **17** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - දිවිදොස්
B - රෝග නිවාරණය
C - වඩමෝඩි
D - තෛපොංගල්
E - පිරිපත
F - යුගාසන බණ
G - ආලවක දමනය
H - තෙන්මෝඩි
I - පාස්කු භෝජනය
J - සශ්‍රීකත්වය
K - විජය රජ
L - නානුමුරය
M - ජනවාරි
N - කප්පුයක්කාරිය

12. බෞද්ධ පූජාකර්ම ආශ්‍රිත වන්නේ,
(1) A හා G ය. (2) F හා G ය. (3) F හා J ය. (4) K හා F ය. (5) M හා N ය. (.........)

13. කොහොඹා කංකාරිය හා සම්බන්ධ වන්නේ,
(1) A හා K ය. (2) B හා G ය. (3) B හා J ය. (4) E හා F ය. (5) L හා N ය. (.........)

14. පාස්කු නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
(1) A හා E ය. (2) B හා I ය. (3) C හා J ය. (4) E හා I ය. (5) E හා L ය. (.........)

15. දේශීය ශාන්තිකර්ම හා පොදුවේ සම්බන්ධ වන්නේ,
(1) A හා B ය. (2) A හා N ය. (3) B හා J ය. (4) B හා K ය. (5) F හා G ය. (.........)

16. දෙමළ උත්සව හා සම්බන්ධ වන්නේ,
(1) C හා D ය. (2) C හා M ය. (3) D හා J ය. (4) D හා M ය. (5) F හා H ය. (.........)

17. දෙමළ නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
(1) C හා D ය. (2) C හා H ය. (3) C හා K ය. (4) D හා M ය. (5) H හා J ය. (.........)

18. පහත දැක්වෙන පද යුගල අතුරෙන් සංස්කෘත නාට්‍යයට අදාළ වරණය තෝරන්න.
(1) වෙළඳ ශ්‍රේණි, සාතන්
(2) අනාවරණය, ආකුලීකරණය
(3) හනම්චිය, ෂිතෙ
(4) ක්යෝගෙන්, පුෂිකදෙන්
(5) යවනිකාව, මත්තවාරණිය (.........)

19. "සුවඳ පද්ම ඕලු ආදි........." ගීතය ඇතුළත් ව ඇත්තේ,
(1) පද්මාවතී නූර්තියෙහි ය.
(2) දුටුගැමුණු නූර්තියෙහි ය.
(3) රාමායණ නූර්තියෙහි ය.
(4) සිරිසඟබෝ නූර්තියෙහි ය.
(5) කුස නාඩගමේ ය. (.........)

20. නාට්‍යයක ප්‍රධාන සහ අප්‍රධාන චරිත වශයෙන් පහත දැක්වෙන වර්ගීකරණයේ ජපාන නාට්‍යයට අදාළ වරණය තෝරන්න.
(1) කොකත සහ ඔන්නගත (2) ෂිතෙත්සුරෙ සහ වකිත්සුරෙ
(3) පෙරෂිතෙ සහ පසුෂිතෙ (4) තොමො සහ කොකතා
(5) ෂිතෙ සහ වකි (.........)

21. "සොයන්නෝ කවරහු ද මේ සොහොනෙහි කිතුනුවනි" මෙම සංවාද ඛණ්ඩය අයත් වන්නේ,
(1) සදුපදේශ නාට්‍යයට ය. (2) ප්‍රාතිහාර්ය නාට්‍යයට ය.
(3) පාස්කු නාට්‍යයට ය. (4) එළිසබෙතීන නාට්‍යයට ය.
(5) එඩේර නාට්‍යයට ය. (.........)

22. 'අඹ විදමන' සහ 'මරා ඉපැද්දීම' යන නාට්‍යමය අවස්ථා අන්තර්ගත වන්නේ,
(1) කොහොඹා කංකාරියට ය. (2) සන්නියකුම් යාගයට ය.
(3) රිද්දි යාගයට ය. (4) බලි යාගයට ය.
(5) ගම්මඩු ශාන්තිකර්මයට ය. (.........)

● ප්‍රශ්න අංක **23** සිට **28** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන A, B, C, D, E හා F ලෙස නම්කර ඇති ඡායාරූප සැලකිල්ලට ගන්න. එක් එක් ප්‍රශ්නයේ නිවැරදි පිළිතුරට අදාළ **අංකය**, ඉදිරියෙන් ඇති **වරහන තුළ** ලියන්න.



A B C D E F

23. ටාර්තා රංග රීතිය අනුගමනය කළ නාට්‍යකරුවා දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද?
(1) B (2) C (3) D (4) E (5) F (.........)

24. දේශීය ශාන්තිකර්ම පිළිබඳ පර්යේෂණ කළ නාට්‍යකරුවා දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද?
(1) A (2) C (3) D (4) E (5) F (.........)

25. ශේක්ස්පියර් නාට්‍ය කිහිපයක් සිංහලයට පරිවර්තනය කළ නාට්‍යකරුවා දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද?
(1) A (2) B (3) D (4) E (5) F (.........)

26. දේශපාලන ගැටලු නිරන්තර සාකච්ඡාවට ලක් කළ නාට්‍යකරුවා දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (5) F (.........)

27. 'රාවණේසන්' නිෂ්පාදනය කළ නාට්‍යකරුවා දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද?
(1) B (2) C (3) D (4) E (5) F (.........)

28. බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්ගේ නාට්‍යයක් ප්‍රථමවරට සිංහල වේදිකාවේ නිෂ්පාදනය කළ නාට්‍යකරුවා දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (5) F (.........)

29. සොකරි නාටකය සඳහා භාවිත කෙරෙන වාද්‍ය භාණ්ඩ වනුයේ,
(1) මද්දලය හා තාලම්පොට ය. (2) ගැටබෙරය හා හොරණෑව ය.
(3) සෙරපිනාව හා තබ්ලාව ය. (4) දවුල හා හොරණෑව ය.
(5) යක්බෙරය හා හොරණෑව ය. (.........)

30. නාඩගමට අදාළ වරණය තෝරන්න.
(1) නිශ්චිත පිටපතක් නොමැත. (2) උත්තර භාරතීය සංගීතය යොදා ගැනේ.
(3) ස්ත්‍රී චරිත රඟපාන ලද්දේ ස්ත්‍රීන් විසිනි. (4) නිශ්චිත පිටපතක් ඇත.
(5) පූර්ව රංගයක් නො වී ය. (.........)

31. නූතන බටහිර ප්‍රකාශනවාදී නාට්‍යයක් වන්නේ කුමක් ද?
(1) සමාජයේ කුලුනු (2) පුංචි පළිඟු රැන
(3) ගොඩෝ එනකං (4) රයිනෝසිරස්
(5) අංගාරා ගඟ ගලා බසී (.........)

32. ස්වාභාවික නාට්‍ය රීතියේ පුරෝගාමියකු ලෙස සැලකෙන්නේ,
(1) හෙන්රික් ඉබ්සන් ය. (2) කොන්ස්ටාන්ටින් ස්ටැනිස්ලාව්ස්කි ය.
(3) එමිලි සෝලා ය. (4) ෂොන් පෝල් සාත්‍රේ ය.
(5) ටෙනසී විලියම්ස් ය. (.........)

33. අර්වින් පිස්කැටර් සම්බන්ධ වන්නේ,
(1) සාන්දෘෂ්ටික වාදයට ය. (2) ආඛ්‍යාන රංගයට ය.
(3) තාත්ත්වික සම්ප්‍රදායට ය. (4) ස්වාභාවික සම්ප්‍රදායට ය.
(5) අභූතරූපී රංගයට ය. (.........)

34. පශ්චාද් දෘෂ්ටි කථන ස්වරූපය දක්නට ලැබෙන්නේ පහත දැක්වෙන කවර නාට්‍ය සම්ප්‍රදායක ද?
(1) සංස්කෘත නාට්‍ය (2) ග්‍රීක ට්‍රැජඩි
(3) ජපාන නෝ නාට්‍ය (4) එළිසබෙතීන නාට්‍ය
(5) අභූතරූපී නාට්‍ය (.........)

35. (A) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්
(B) ඇරිස්ටොෆානිස්
(C) හැරල්ඩ් පින්ටර්
(D) සිනෙකා
(E) ශේක්ස්පියර්
(F) මිනැන්ඩර්
ඉහත නම් සඳහන් නාට්‍යකරුවන් කාලානුරූපී ව ගොනු කොට ඇති නිවැරදි වරණය තෝරන්න.
(1) A B C D E F (2) A C D B F E
(3) B F D E A C (4) B C D A E F
(5) B F D C A E (.........)

● පහත දැක්වෙන පාරිභාෂික පද ඇසුරෙන් **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - භාවමය ස්මෘතිය
B - කුසුම
C - තදාත්ම්‍ය විසටනය
D - තද්විධි ක්‍රමය
E - රසවාදය
F - කරුණාව සහ බිය
G - හන
H - භාව විශෝධනය
I - භාව
J - ආඛ්‍යානය

36. ග්‍රීක නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
(1) A සහ C ය. (2) A සහ D ය. (3) C සහ D ය. (4) E සහ G ය. (5) F සහ H ය. (.........)

37. සංස්කෘත නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
(1) A සහ I ය. (2) C සහ D ය. (3) E සහ I ය. (4) E සහ J ය. (5) G සහ H ය. (.........)

38. නූතන යුරෝපීය නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
(1) A සහ B ය. (2) A සහ D ය. (3) C සහ D ය. (4) E සහ H ය. (5) G සහ I ය. (.........)

39. එපික් නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
(1) A සහ G ය. (2) C සහ J ය. (3) E සහ F ය. (4) E සහ I ය. (5) H සහ I ය. (.........)

40. ජපන් නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
(1) A සහ F ය. (2) B සහ G ය. (3) C සහ J ය. (4) E සහ F ය. (5) H සහ I ය. (.........)

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2015 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2015

නාට්‍ය හා රංගකලාව - සිංහල II
நாடகமும் அரங்கியலும் - சிங்களம் II
Drama and Theatre - Sinhala II

57 S II

## II කොටස

**උපදෙස්:**
※ **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

### A - දේශීය නාට්‍ය කලාව

1. (i) ශ්‍රී ලංකාවේ උඩරට හා පහතරට සම්ප්‍රදායනට අයත් ප්‍රධාන ශාන්තිකර්ම **දෙක** බැගින් ලියා දක්වන්න. (ලකුණු 04 යි.)
   (ii) ඒ අතුරෙන් උඩරට සම්ප්‍රදායට අයත් ප්‍රධාන ශාන්තිකර්මයක මූලික ලක්ෂණ **පහක්** දක්වන්න. (ලකුණු 05 යි.)
   (iii) පහතරට සම්ප්‍රදායට අයත් ශාන්තිකර්ම **දෙකක** මූලික ලක්ෂණ **තුන** බැගින් වෙන වෙන ම ලියා දක්වන්න. (ලකුණු 06 යි.)

2. (i) සොකරි සහ කෝලම් නාට්‍ය සම්ප්‍රදායන් ප්‍රචලිත ප්‍රදේශ **දෙක** බැගින් නම් කරන්න. (ලකුණු 04 යි.)
   (ii) සොකරි නාටකයේ ප්‍රමුඛ චරිත **පහක්** නම් කර, ඒ එකිනෙක පිළිබඳ ව කෙටි සමාලෝචනයක් කරන්න. (ලකුණු 05 යි.)
   (iii) කෝලම් චරිත සඳහා පලඳිනු ලබන වෙස් මුහුණු වර්ග **හයක්** නම් කර, ඒ එකිනෙක පිළිබඳ ව කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 06 යි.)

3. (i) 'සුභ සහ යස' නාට්‍යයේ හා 'හස්තිකාන්ත මන්තරේ' නාට්‍යයේ කථා නායකයන් නම් කරන්න. (ලකුණු 04 යි.)
   (ii) 'සුභ සහ යස' නාට්‍යයේ ගැටුම පිළිබඳ විමර්ශනයක් කරන්න. (ලකුණු 05 යි.)
   (iii) 'හස්තිකාන්ත මන්තරේ' ලබා ගැනීම සඳහා චණ්ඩපජ්ජෝත රජු අනුගමනය කරන ක්‍රියා කලාපය සඳහන් කොට, ඒ පිළිබඳ ඔබේ අදහස පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

### B - විදේශීය නාට්‍ය කලාව

4. (i) 'ඇන්ටිගනී' නාට්‍යයේ ගැටුමට තුඩුදෙන ප්‍රධාන සාධක **දෙක** සඳහන් කරන්න. (ලකුණු 04 යි.)
   (ii) ඇන්ටිගනීගේ චරිතයේ උදාර ලක්ෂණ හා දුර්වල ලක්ෂණ හුවා දක්වන්න. (ලකුණු 05 යි.)
   (iii) ක්‍රියොන්ගේ තීරණය වෙනස් කිරීමට බලපෑම් කරන සෙසු චරිත ගැන විමසීමක් කරන්න. (ලකුණු 06 යි.)

5. (i) 'ජුලියස් සීසර්' ඓතිහාසික මෙන් ම දේශපාලන නාට්‍යයක් ලෙස සැලකෙන්නේ මන් ද? (ලකුණු 04 යි.)
   (ii) එම නාට්‍යයේ පොදු මහජනයාගේ ක්‍රියා කලාපය ඔබ දකින්නේ කෙලෙස ද? (ලකුණු 05 යි.)
   (iii) එම නාට්‍යයේ ස්ත්‍රී භූමිකා ගැන විමසීමක් කරන්න. (ලකුණු 06 යි.)

   **නැතහොත්**

   (i) 'ඔතෙලෝ' නාට්‍යයේ ඔතෙලෝ බේදය කරා ගමන් කරන්නේ ඔහුගේ කවර දුර්වලකමක් නිසා දැ'යි පහදන්න. (ලකුණු 04 යි.)
   (ii) ඔතෙලෝට වෛර කිරීමට ඉයාගෝ පෙලඹෙන්නේ කුමක් නිසා දැයි පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)
   (iii) ඔතෙලෝ කළු ජාතිකයකු කිරීමෙන් ශේක්ස්පියර් ඉටු කරගැනීමට අපේක්ෂා කළේ කවර අරමුණක් ද? (ලකුණු 06 යි.)

6. (i) 'රූකඩ ගෙදර' නාට්‍යය එනමින් හැඳින්වෙන්නේ කවර හෙයින් ද? (ලකුණු 04 යි.)
   (ii) එහි ප්‍රධාන වේදිකා මෙවලම නම් කොට, ඉන් කුමක් සංකේතවත් වන්නේ දැයි පහදන්න. (ලකුණු 05 යි.)
   (iii) එම නාට්‍යය ලිවීමේ දී ඉබ්සන් අනුගමනය කළ රංග රීතිය කුමක් ද? (ලකුණු 06 යි.)

※ ※ ※